# අයෝජන අවස්ථා හඳුනාගැනීම

''මුදල් ගස් වල වැවෙන්නේ නැහැ'' යන කියමන බොහෝ ප්‍රකට කියමනකි. නමුත් නිසි සැලසුමකට අනුව මුදල් ආයෝජනය කිරීම තුළින් හොඳ අස්වැන්නක් නෙලා ගැනීමේ හැකියාව තිබේ. ඒ සඳහා නිසි මඟ විවර කරදෙන උපදෙස් පෙළක් මෙම ලිපිය මඟින් ඔබ වෙත ගෙන එන්නේ එබැවිනි.

තමන් සතු මූල්‍ය වත්කම් වර්ධනය කරගත හැකි බොහෝ දෙනා දන්නා සරල ක්‍රමවේදය ඉතුරුම් තැන්පතු වන නමුත් ඊට වැඩි ප්‍රතිලාභ අත්කර දෙන ආයෝජන අවස්ථා රැසක් පවතී.

## ඉතුරුම් සහ ආයෝජන අතර පවතින වෙනස

ඉතුරුම් සහ ආයෝජන දෙස එකවර බැලීමේ දී සමාන කමක් දිස් වුවද එහි ව්‍යුහමය සහ ක්‍රියාකාරිත්වය තුළ වෙනස්කම් පවතී. ඉතුරුම් යනු පසුව පරිහරණය සඳහා එකවර හෝ කොටස් වශයෙන් මුදල් තැන්පත්කර තැබීමයි. ඉතුරුම් ගිණුම් මත පොළිය එකතු වන නමුත් ආයෝජන ඊට වඩා පියවරක් ඉදිරියෙන් පවතින වැඩි ප්‍රතිලාභ අත්කරදෙන ක්‍රමවේදයකි. ආයෝජනවල නිරත වීම ඉතුරුම් ගිණුම්වලට වඩා අවදානම් වුවද සැලසුම් සහගතව සහ සක්‍රීයව අවදානම් අවම කර ගැනීමට නිසි ක්‍රමවේද පිළිපදිමින් ආයෝජනවල නියැලීම සවිමත් හා අවදානම් අඩු ආයෝජනයකට මග සලසයි .

## අවදානම හඳුනාගැනීම

ඉතුරුම් ගිණුම් මෙන් නොව ආයෝජනය හරහා ලැබෙන ආදායම් පිළිබඳ නිෂ්චිත තක්සේරුවක් ලබාදීම තරමක් අපහසු කර්තව්‍යයකි. මන්ද මූල්‍ය වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය , පොළී අනුපාත, උද්ධමනය, විනිමය සහ දේශපාලන ප්‍රවනතාවයන් යන අවදානම්, අයෝජන හරහා ලැබෙන ප්‍රතිලාභ සඳහා බලපාන සාධකයක් වන බැවිනි. නමුත් සිය අවශ්‍යතාවයන්ට ගැලපෙන, අවදානම් නිසි ලෙස කළමනාකරනය කර ගැනීමෙන් ආයෝජන මඟින් ලැබෙන ඉහළ ප්‍රතිලාභ අත්විඳීමේ අවස්ථාව උදාකර ගැනීමේ හැකියාව පවතින අතර ආයෝජන විවිධාංගිකරණය හරහා එම අස්ථිර බව මගහරවා ගත හැක.

එකම මෙවලමක ආයෝජනයන් නොකොට, ආයෝජන විවිධාංගීකරණය මඟින් ආයෝජකයාට ආයෝජන අතර අවදානම අවම කරගත හැක. කෙටි කාලීන සහ දිගු කාලීන මූල්‍ය ඉලක්ක හඳුනාගැනීමත්, එය මුල් කොටගෙන ආයෝජන අවස්ථා තෝරා ගැනීමත් වැදගත් වේ .

## ආයෝජන ඉලක්ක සහ කාලවකවානු සැලසුම් කිරීම

ඔබගේ ආයෝජන සැලසුම් කිරීමට පෙර එය සඳහා යෙදවිය හැකි ( මාසිකව, කොටස් වශයෙන් හෝ සම්පූර්ණ ගෙවීමක් වශයෙන් ) මූල්‍ය ධාරිතාවය සහ ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන කාලවකවානු පිළිබඳ සැලකිලිමත් විය යුතුය. එලෙසම ඔබගේ ආයෝජන හැකියාවන් සහ ආදායම් ලැබිය යුතු ආකාරය හඳුනාගත ගත යුතුයි . උදාහරණයක් ලෙස විශ්‍රාම ගිය පසු මාසික ආදායමක් ලෙස ප්‍රතිලාභ ලබා ගැනිමට හෝ දරුවකුගේ උසස් අධ්‍යාපනය සඳහා කරුණු සැළකිල්ලට ගනිමින් ආයෝජන අවස්ථා පිළිබඳ තීරණය කළ හැකිය. එලෙස මූල්‍ය ඉලක්ක සහ ගත හැකි අවදානම් සැලකිල්ලට ගනිමින් ඔබගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන විවිධාංගිකරණයෙන් යුත් ආයෝජනයක යෙදිය හැක .

අඩු ප්‍රතිලාභ හිමිකරදෙන ආයෝජන අවස්ථා අඩු අවදානමකින් යුක්ත වන අතර ප්‍රතිලාභ ඉහළ ආයෝජන අවස්ථා අවදානමින් වැඩි අවස්ථා වේ.

ඔබ මහත් වෑයමකින් උපයන ලද මුදල් ආයෝජනය කිරීමේ දී තෝරාගන්නා ආයෝජන මෙවලම් පිළිබඳ මෙන්ම එම ආයතනය පිළිබඳ වඩාත් ගැඹුරින් අධ්‍යයනය කළ යුතු වන අතර ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳ ප්‍රශ්න විමසමින් තොරතුරු දැන ගැනීමේ අයිතිය ඔබ සතුව ඇත.

## ආයෝජන මෙවලම්

පෙර සඳහන් කළ පරිදි ආයොජනයක යෙදීමට පෙර ආයෝජන කාලසීමාව සහ අවදානම සැලකීම මගින් වඩාත් සුදුසු ආයෝජන මෙවලම් තෝරා ගත හැක. ස්ථාවර තැන්පතු ගිණුම් වලට අමතරව භාණ්ඩාගාර බැඳුම්කර, කොටස් වෙළෙඳපොළ හරහා හුවමාරු වන ලැයිස්තුගත කොටස් සහ සාංගමික ණය, ලැයිස්තුගත නොවන භාරකාර තැන්පතු, වානිජ පත්‍ර සහ ඒකක භාර ( units ) ඇතුළු පෞද්ගලික කොටස් වඩාත් ප්‍රචලිත ආයෝජන මෙවලම් වේ.

**සටහන 01 - ආයෝජන මෙවලම් , ආයෝජන කාල සීමාව සහ අවදානම් මට්ටම පිළිබඳව දැක්වේ**

| ආයෝජන මෙවලම | අවධානම් මට්ටම | ආයොජන කාල සීමාව |
|---|---|---|
| ඒකක භාර | ☆ ඉතා පහළ මට්ටමේ සිට ඉහළ | කෙටි කාලීන හෝ දිගු කාලීන ☆ |
| ස්ථාවර තැන්පතු | අවම | කෙටි කාලීන හෝ දිගු කාලීන |
| භාණ්ඩාගාර බැඳුම්කර<br>රාජ්‍ය සුරැකුම්පත් | ඉතා අවම | කෙටි කාලීන හෝ දිගු කාලීන |

| | | |
|---|---|---|
| ලැයිස්තුගත සාංගමික ණය | පහළ | කෙටි කාලීන හෝ දිගු කාලීන |
| ලැයිස්තුගත නොවන සාංගමික ණය | මධ්‍ය මට්ටමේ සිට ඉහළ | මධ්‍ය කාලීන සිට දිගු කාලීන |
| ලැයිස්තුගත සාංගමික කොටස් | මධ්‍ය මට්ටමේ සිට ඉහළ | මධ්‍ය කාලීන සිට දිගු කාලීන |
| පෞද්ගලික සාංගමික කොටස් හා ණය | ඉහළ | දීර්ඝ කාලීන |

**සටහන -01**

★ තෝරා ගන්නා ඒකක භාරයේ සංයුතිය මත.............

## ආයෝජනයක යෙදීමට පෙර

ආයෝජන මෙවලම් හා කාලසීමා අධ්‍යනය කිරීමෙන් පසු බදු ගෙවීම් වැනි ඔබගේ මූල්‍ය වගකීම් සඳහා අවශ්‍ය ආදායම් කොටසක් වෙන්කොට තබන්න. ස්වයං අධ්‍යයන හරහා රැස්කරගත් දැනුම මත ඔබ මුදල් ආයෝජනය කිරීමට සැරසෙන්නේ නම් සහතිකලත් ආයෝජන උපදේශකයෙකුගෙන් ඔබගේ ආයෝජන තෝරාගැනීම පිළිබඳ පවසා අවශ්‍ය මඟ පෙන්වීම ලබාගැනීම තුළින් අවදානම අවම කර ගැනීමේ හැකියාව පවතී. ඔබ විසින් සිදුකළ අධ්‍යයන හරහා සැලසුම් කළ ඉලක්ක වෙත පහසුවෙන් ළඟා වීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබාදෙමින් අවදානම නිසි ලෙස කළමනාකරණය කොට ආයෝජනයේ උපරිම ඵල නෙලා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය එම වෘත්තිමය නිපුණයින් විසින් ඔබට ලබාදෙනු ඇත.

මහ බැංකුව, ශ්‍රී ලංකා විනිමය සුරැකුම්පත් කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොල මඟින් ආයෝජකයින්ට අවශ්‍ය උපදෙස් සහ මඟ පෙන්වීම ලබාගැනීමේ හැකියාව පවතී.

**තොරතුරු -දිමන්ත මැතිව්**

**පර්යේෂණ කළමණාකරු**

**ෆස්ට් කැපිටල් ඉක්වටිස් පුද්ගලික සමාගම**